**10 ශ්‍රේණිය.**
**සිංහල භාෂාව හා සාහිත්‍යය**
**දෙවෙනි වාරය - දොළොස්වෙනි සතිය.**

<u>ක්‍රියාකාරකම.</u>

- බැද්දේගම නවකතාව ඇසුරෙන් පහත විචාර ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

1. ''බැද්දේගම නවකතාවේ අපට හමුවන පුන්චි මැණිකාගේ චරිතයෙන් නිරූපණය වන්නේ සොබා දහමෙන් ද සමාජ බලවේග මගින්ද පීඩාවට පාත්‍ර වූ තැනැත්තියකි.'' නවකතාවේ නියමිත කොටසින් උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

*(ලකුණු 10 යි)*

2. ''අවුරුදු දහයකින් මුළු ගම ම අලින්ට යනවා'' නැන්චො හාමි පළකළ ඉහත අනාවැකිය ක්‍රමයෙන් සනාථ වූ අයුරු නවකතාවේ නියමිත කොටසින් උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

*(ලකුණු 10 යි)*

3. ''බැද්දේගමත් එහි වැසියනුත් ක්‍රමයෙන් අභාවයට යන ආකාරය සජීවී ලෙස නිරූපණය කිරීමට කතුවරයා භාෂාව මැනවින් භාවිත කර ඇත'' නවකතාවේ නියමිත කොටසින් උදාහරණ තුනක් දක්වමින් ඉහත කියමන සනාථ කරන්න.

*(ලකුණු 10 යි)*

4. බැද්දේගම කෘතිය,
   i. සාහිත්‍ය කෘතියක් වශයෙන් මෙන් ම
   ii. අතීත ලංකාවේ ජනජීවිතය පිළිබඳ තොරතුරු හෙළි කරන ග්‍රන්ථයක් වශයෙන්දවැදගත් වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

*(ලකුණු 15 යි)*

5. බැද්දේගම කෘතියෙහිලා,
   i. අවස්ථා නිරූපණයට මෙන්ම
   ii. චරිත නිරූපණයට,

   උචිත වූ බස් වහරක් උපයෝගී කර ගැනීමට කතුවරයා උත්සුක වී ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

*(ලකුණු 15 යි)*

* * *

සැකසුම
ජගත් කුමාර ජයසිංහ
ගුරු උපදේශක
දෙහිඹිවිට අධ්‍යාපන කලාපය